checked 29/3/74

# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 84 — 1973 නොවැම්බර් 02 වැනි සිකුරාද — 1973.11.02**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)**


# I වැනි කොටස: (II.අ) වැනි ඡේදය — පළකිරීම්

**(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**

සැළකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරණ රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත 1973 නොවැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු — ඇබෑර්තු ... ... ... ... | 1491 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය — — — | — |


## තනතුරු — ඇබෑර්තු

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරවනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළවන පොදු කොන්දේසි**

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනෙක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්. රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන්ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

**2. දීමනා**

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයන්හි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. ඩී. සිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---


1491—ශී 71067—15,017 (73/10)

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ශ්‍රේණියට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි : සාමාන්‍ය**

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 :1 ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසි වලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ :—

4 :1 :1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 :1 :2 රාජ්‍ය සේවයෙහි " නව ප්‍රවේශකයන් " වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්වන්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකිවූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 :3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීනතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී තව මාස හයක කල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එකී ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4, සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේ ය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු, සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/ තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ක් දක්වා වූ සෙවච්ඡා දායක මුදලක් එම කරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම් නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස් වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 5 වැනි දිනට පෙරාතු නම්ද ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස් වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමතමන් සේවය කළ කාලයක් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරට තෝරාගනු ලැබුව හොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම්කිසි සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

**8. සුදුසුකම පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

---

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

භාෂා පරිවර්තක තනතුරු (ඉලක්ක භාෂාව : දෙමළ)

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක (ඉලක්ක භාෂාව : දෙමළ) තනතුරු සඳහා මෙසින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙළ කොට 1973.11.23 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් වැටුප් පරිමාණය රු. 6,600—රු. 180 හා රු. 240—රු. 9,240 කි. රු. 8,280 වාර්ෂික වැටුප් ලක්ෂ්‍යයට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :—**

(i) මෙම තනතුරු ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් අහිමිය. පත්වීම අර්ථසාධක අරමුදල් පදනම මත වනු ඇත. මෙම තනතුරුට පත් කරනු ලබන්නේ අවුරුදු තුනක පරීක්ෂණ කාලයක් පිටස. අංක 765 සහ 69.06.09 දිනැති භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 2 වන ඡේදයේ (අ) සහ (ආ) වගන්ති අදාළ වනු ඇත.

(ii) සුළු කාලයක් ඇතුළත දී තනතුරේ වැඩ බාර ගන්නා ලෙස තෝරා ගත් අපේක්ෂකයන්ට නියම කරනු ලැබේ.

(iii) පත් කිරීමේ දින සිට අවුරුදු තුනක් ඇතුළත අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ සිංහල භාෂා විෂයයෙන් සමත් විය යුතුය.

සැ. යු.—අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාග මට්ටමෙන් හෝ ඊට ඉහළ මට්ටමකින් සිංහල භාෂා දැනුමක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(iv) අයත් කාර්ය නම් : ඉංග්‍රීසියෙන් දෙමළට හෝ දෙමළෙන් ඉංග්‍රීසියට හෝ අවශ්‍ය ඥානය ලැබීමෙන් පසු කෙළින්ම දෙමළෙන් සිංහලට හෝ සිංහලෙන් දෙමළට හෝ පරිවර්තනය කිරීම, වෙනත් දෙපාර්තමේන්තු වලින් ලැබෙන සිංහල හෝ දෙමළ පරිවර්තන ප්‍රතිශෝධනය කිරීම සහ වෙනත් අයුරින් දෙපාර්තමේන්තුවට සහාය වීමද වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) 1973. 11. 23 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු හා අවුරුදු 50 ට නොවැඩි බව.

(දැනටමත් රජයේ සේවයෙහි නියුක්තව සිටින අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(ඇ) (i) දෙමළ විෂයයක් වශයෙන් ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලද්දා වූ ද, ඉංග්‍රීසි භාෂා විෂයෙහි විශිෂ්ඨ දැනුමක් ඇත්තාවූ ද උපාධිධාරියකු බව ; හෝ

(ii) උපාධිධාරීන්ට සමාන ප්‍රවීණත්වයක් හා ඉංග්‍රීසි භාෂා වෙහි හසළ දැනුමක් ඇති දෙමළ ලේඛකයකු නොහොත් ග්‍රන්ථ කර්තෘවරයෙකු හෝ අවුරුදු 10 ක පළපුරුද්දක් ඇති දෙමළ පරිවර්තකයකු බව.

5. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් ලියවිලිවල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න ලියා පදිංචි කිරීමේ සහතිකය.

(ii) උසස්ම අධ්‍යාපන සහතිකය, සහ

(iii) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින ඉල්ලුම් කරුවන්ගෙන් මේවා බලාපොරොත්තු නොවේ.)

සැ. යු.—ඉහත සඳහන් සහතික පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි යම් අවාසියක් වෙතොත් එය අයදුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතු වේ. ආණ්ඩුවේ හා සංස්ථා සේවයෙහි නියුක්ත නිලධාරීන්ට එවන අයදුම් පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණහොත්, ඒ අයදුම් පත් බාරගනු ලබන්නේ ඒවා නියමිත දිනට කලින් දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ ප්‍රධානයාට ලැබී තිබුණහොත් ද, ඒවා ප්‍රමාද වීමට සැහෙන හේතු දක්වමින් එම අයදුම් පත් බාරගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ ප්‍රධානියා නිර්දේශ කරතොත් ද පමණකි.

7. අයදුම් පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් එවිය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොව, "රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්, තැ. පෙ. 598, 22, ඊඩ් මාවත, කොළඹ 7" යන ලිපිනයටය.

8. එවන සෑම අයදුම්පතක් ම ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම් පත් බාර ගන්නා අවසාන දිනයේ සිට සතියක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවෙකුට නොලැබුණහොත්, ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්ට වහාම දන්වා එවිය යුතුය. එසේ නොකරන අයගේ හිමිකම් ගැන සලකා බලනු නො ලැබේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද, රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන්නාවූද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
22, ඊඩ් මාවත,
කොළඹ 7.
1973. 10. 23.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### භාෂා පරිවර්තක (ඉලක්ක භාෂාව : දෙමළ) තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

(සැ. යු.—ඉල්ලුම් පත්‍රය බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "භාෂා පරිවර්තක (ඉලක්ක භාෂාව—දෙමළ) තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි තැපෑලෙන් රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් වෙත එවිය යුතුය.)

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)
1973. 11. 23 වැනි දිනට වයස :—අවුරුදු :——, මාස :——, දින :——.

(4) ජාතිය :————.

(5) විවාහකද, අවිවාහක ද යන බව :————.

(6) (අ) අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)
(ආ) දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂා විෂයයන් වශයෙන් ඇතිව සාමාර්ථය ලත් උසස් ම විභාගය :—
දෙමළ :————.
සිංහල :————
ඉංග්‍රීසි :————.
(ඇ) පරිවර්තන වැඩ සම්බන්ධයෙන් පළපුරුදුකම් තිබේ නම් විස්තර සඳහන් කරන්න :————.
(ඈ) සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම් තිබේ නම්, ඒවාද සඳහන් කරන්න :————.

(7) (අ) පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.
(ආ) රජයේ සේවයේ යෙදී සිටී නම්, දැනට දරණ තනතුරු හා ලබන වාර්ෂික වැටුප සඳහන් කරන්න :————.

(8) මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවල සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

(9) යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදි කරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

(10) චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදිංචි නාම :————.
(1) ————.
(2) ————.
(3) ————.

මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

අත්සන.

දිනය :————.

11-110—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### පොල්ගොල්ලේ සමුපකාර අභ්‍යාස විද්‍යාලයේ නීති පිළිබඳ කථිකාචාර්ය තනතුර

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොල්ගොල්ල සමුපකාර අභ්‍යාස විද්‍යාලයෙහි, නීති පිළිබඳ කථිකාචාර්ය තනතුරක් සඳහා අයදුම්පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

මෙම ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගනු ලබන අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර, කොළඹ 2, තැ.පෙ. 560, විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(අ) **මෙරට ඉල්ලුම්පත්.**—1973 නොවැම්බර් මස 22 වැනිද

(ආ) **විදේශීය ඉල්ලුම්පත්.**—1973 නොවැම්බර් මස 29 වැනිද

**සටහන්.**—(i) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරාගත යුතුය.

(iii) පිටරට අයදුම්කරුවන්ට තම ඉල්ලුම්පත්‍ර විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කර සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**— ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවේ.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) මෙම තනතුර ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් පදනමක් මත වනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා වැටුපෙන් සියයට 6ක මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. රජයේ දායක මුදල ඒකාබද්ධ වැටුපෙන් සියයට 9ක් වනු ඇත. නමුත් රජයේ සේවයෙහි දැනටමත් නියුක්ත ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ අපේක්ෂකයින්ට තවදුරටත් එම විශ්‍රාම වැටුප් හිමිකම් ලැබෙනු ඇත.

(ii) (අ) තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් පත්කරනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත්වය. දැනට රජයේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් නියමිත කාලසීමාවකට වැඩ බැලීමකට පත් කරනු ඇත.

(ආ) තෝරාගනු ලබන රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් පත් කරනු ලබන්නේ පළමුවෙන් එක් අවුරුදු කාලසීමාවකට වැඩ බැලීමේ පදනමක් මතය. එම කාලය අවසානයේ දී නිලධාරියා සුදුස්සෙකු බව පෙනී ගියහොත් ඔහු තනතුරේ ස්ථිර කරනු ඇත. වැඩ බලන කාලය තුලදී ඔහු මෙම තනතුර සඳහා නුසුදුසු බව පෙනී ගියහොත් ඔහු කලින් සිටි තනතුරට ආපසු යවනු ලැබේ.

3. **වැටුප් හා දීමනා.**—මෙ තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය :—රුපියල් 7,800 න් පටන්ගෙන රුපියල් 360වෙ වැඩිවීම් 9කින් රුපියල් 11,040 දක්වා වැඩිවේ. (1969.10.01 දිනට පෙර පැවති වාර්ෂික අනුරූප මූලික වැටුප් ක්‍රමය රුපියල් 5,160—360—රු. 8,400 වේ).

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම පිණිස සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුක්ත බව ;

(ආ) 1973 නොවැම්බර් මස 22 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු බව හා අවුරුදු 40 ට නොවැඩි බව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත) ;

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් හෝ නීතිය එක් විෂයයක් වශයෙන් ඇතිව උපාධියක් හෝ නීතිය එක විෂයයක් වශයෙන් ඇතිව සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක් ;

සටහන:—පළමුවෙනි හෝ දෙවෙනි පෙළ සම්මාන සහිත උපාධියක් සහ ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) සිංහල භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පැවැත්වීමට හැකි බව.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ) ;

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයෙකුගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය ;

(ඈ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපත් හෝ ඇමිණිය යුතු නොවේ.

(ii) ඉල්ලා සිටි අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත හැර කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II අ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. ඉල්ලුම්පත්‍ර මෙම කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම මා වෙත දැනුම්දිය යුතුය.

ජයන්ත කැලේගම,<br>
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 23 වැනි දින,<br>
කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 හි,<br>
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

(අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය )

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව—නීති පිළිබඳ කථිකාචාර්ය තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය) :————.

3. (අ) උපන් දිනය :—

වර්ෂය :————. මාසය :————. දිනය :————.

(ආ) දේශීය ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :—

වර්ෂය :————. මාසය :————. දිනය :————.

4. ඔබ ලංකා රටවැසියෙක්ද ? පාරම්පරික රටවැසියෙක් ද ? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සහතිකයේ යොමු අංකය හා දිනය සඳහන් කරන්න) :————.

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශවයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශවයේ මී මුත්තාගේ :————.

(ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

6. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක්ද, වැන්දඹුවක්ද යන බව :————.

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලාව, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |

9. ක්‍රීඩා පිළිබඳව ලබා ඇති විශිෂ්ටත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිව යුතු පදවි පිළිබඳ විස්තර :————.

10. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද ? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණකට ද ? :————.

11. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක්ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න: ————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

(ලබාගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ට සාමර්ථ, වෘත්තීය සුදුසුකම් වල විස්තර, ඒවායේ දින හෝ පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න.)

13. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් :— (රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

සැළකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහල 15 වෙනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

14. විශේෂ සුදුසුකම් :————.
(දැන්වීමෙහි දක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද? එසේ ඇතහොත් දිනයන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න.)

15. තවත් තොරතුරු කිසිවක් වේනම් ඒවා :————.

16. මෙම අයදුම් පතෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,<br>
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

————,<br>
දිනය :————. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

11–131—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

**පනම්කාමම් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

මුන්ඩුමුරිප්පු වවනිකුලම් සහ වන්නිවිලන්කුලම ග්‍රාම සේවක කොට්ඨාශ ඇතුළු පනම්කාමම් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි. පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973.11.13 වැනි දින හෝ ඊට පෙර මන්නාරම දිසාපති කාර්යාලයේ දිසාපති වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 ක දීමනාවක් ගෙවනු ලැබේ.

3. **සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

(ආ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඇ) යටත් පිරිසෙයින් දෙමළ හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන්ද පළාත් පාලන ආයතනවල නියෝජිතයන්ද මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. එසේ හෙයින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

6. අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වේ. ඉල්ලුම් පත් ලැබී තෙදිනක් ඇතුළත ඒවා ලැබුණු බව දන්වනු ලැබේ.

7. මීට ප්‍රථම ගැසට් නිවේදන අනුව ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අය ඔවුන්ගේ ඉල්ලුම්පත් අළුත්වැඩියා කළ යුතුයි.

එස්. කතිර්කාමනාදන්,
මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති.

1973.10.04 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම් පත

**පනම්කාමම් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරින්) :———.
2. ලිපිනය :———.
3. ස්ථිර පදිංචිය, ස්ථානය හා එහි පදිංචි කාලය :———.
4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට සම්පූර්ණ වයස : ———.
   (ආ) උපන් දිනය සහ ස්ථානය :———.
5. විවාහක, අවිවාහක බව :———.
6. අධ්‍යාපන සුදුසුකම් :———.
7. දැනට කරන රක්ෂාව :———.
8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් එය පිළිබඳ විස්තරය : ———.
9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :———.
10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳව විස්තර : ———.
11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :———.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :———.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

11-15—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

**කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත් වන දොඹම්ගොඩ ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත් පුනාවුගොඩ, ඇලදුව, දොඹම්ගොඩ බටහිර, දොඹම්ගොඩ නැගෙනහිර, නෑහින්න තුඩුගල යන ග්‍රාම සේවක කොට්ඨාශ ඇතුළත් දොඹම්ගොඩ ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂක යන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයේ අන්දමට පිළියෙළ කරන ලද අයදුම්පත් 1973 දෙසැම්බර් 3 වෙනි දිනට හෝ ඊට පෙර "දිසාපති, කච්චේරිය කළුතර" යන ලිපිනයට ලැබෙනසේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. **සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30ට නොඅඩු හා 60ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VIII වන ප්‍රමාණයෙන් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතදී ලබා ගත් සහතික දෙකක්.

5. රජයේ, සංස්ථා හා පළාත් පාලන සේවකයින්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද, මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුය.

පී. ජී. පුංචිහේවා,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේදීය.

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත් වන දොඹම්ගොඩ ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්) :———.
2. ලිපිනය :———.
3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :———.
4. (අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :
   (ආ) උපන් දිනය හා ස්ථානය :———.
5. විවාහක අවිවාහක බව :———.
6. අධ්‍යාපන සුදුසුකම් :———.
7. දැනට කරන රක්ෂාව :———.
8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ———.
9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :———.
10. ඉල්ලුම්කරු ණය ගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ———.
11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ———.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :———.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

11-70—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරි ඇබෑර්තු

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෘෂිකර්ම නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත් කර ගනු ලබන අපේක්ෂකයින් හට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙහි ස්ථිර අධිකාරි පත්වීම් පිරිනමනු ලබන අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය වෙත ඇතුළත් කරනු ලැබේ.

3. (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත්කර ගනු ලබන ඉල්ලුම්කරුවන්ට ඔහුගේ නිලයට අනුකූලවූ මෙහි පහත දක්වා ඇති වැටුප් හා දීමනා ගෙවනු ලැබේ :—

**දෙවැනි ලුතිනන්**—වාර්ෂික වැටුප්—රු. 7,140 (මාසික වැටුප රු. 595)

**ලුතිනන්**—වාර්ෂික වැටුප්—රු. 7,500—5×180—රු. 8,400 (මාසික වැටුප්—රු. 625—5×15—රු. 700)

**කපිතාන්**—වාර්ෂික වැටුප්—රු. 9,240—8×180—රු. 10,680 (මාසික වැටුප්—රු. 770—8×15—රු. 890)

**මේජර්**—වාර්ෂික වැටුප්—රු. 11,400—8×240—රු. 13,320 (මාසික වැටුප්—රු. 950—8×20—රු. 1,110)

**ලුති-කර්නල්**—වාර්ෂික වැටුප්—රු. 15,000—7×360—රු. 17,520 (මාසික වැටුප්—රු. 1,250—7×30—රු. 1,460).

(ආ) පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ :—

**විවාහක නිලධාරීන්ගේ දීමනාව :—**

මසකට රු. 575 හා රු. 600 ට අඩු=මසකට රු. 80.00

මසකට රු. 600 හා රු. 625 ට අඩු=මසකට රු. 82.50

මසකට රු. 625 හා රු. 650 ට අඩු=මසකට රු. 85.00

මසකට රු. 650 හා රු. 675 ට අඩු=මසකට රු. 87.50

මසකට රු. 675 හා රු. 700 ට අඩු=මසකට රු. 90.00

මසකට රු. 700 හා රු. 725 ට අඩු=මසකට රු. 92.50

මසකට රු. 725 හා රු. 750 ට අඩු=මසකට රු. 95.00

මසකට රු. 750 හා රු. 775 ට අඩු=මසකට රු. 97.50

මසකට රු. 775 හා ඉන් ඉහළ=මසකට රු. 100.00

**වෙනත් දීමනා :**

(i) මූලික නිල ඇඳුම් දීමනාව.—රු. 1,000.00.

(ii) නිල ඇඳුම් පවත්වා ගැනීමේ දීමනාව—මසකට රු. 25.00.

(iii) අනුගාමික දීමනාව—විවාහක නිලධාරීන්ට හා පිටත වාසය කිරීමට අවසර ලත් අවිවාහක නිලධාරීන්ට මසකට රු. 75.00 ක්.

(iv) වෙන්ව සිටීමේ දීමනාව :—

(i) සාමාන්‍ය රාජකාරි සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට දින 14 කට නොවැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 1.50 බැගින්.

(ii) හදිසි හා විශේෂ රාජකාරි සඳහා තුල වාසය කිරීමට නියම කර ඇති විවාහක නිලධාරීන්ට දින 14 කට වැඩි අඛණ්ඩ කාලයක් තුල වාසය කිරීම සඳහා දිනකට රු. 2.00 බැගින්.

(v) ගමන් හා ඒකාබද්ධ දීමනා.—රජයේ සේවකයන්ට ගෙවන අයුරුය.

(ඇ) නිලධාරීන්ගේ වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බලපවත්වනු ඇත :—

(i) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද හමුදා වැටුප් සංග්‍රහය.

(ii) 1949 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි.

(iii) 1961 සැප්තැම්බර් මස 28 දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

වෙනත් වැඩි විස්තර කොළඹ, යුද හමුදා මූලස්ථානයෙන් ලබා ගත හැක.

4. අපේක්ෂකයින් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුයි :—

(අ) **ජාතිය.**—ඉල්ලුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ආ) **වයස.**—ඉල්ලුම්කරුවන් 1973.11.24 වැනි දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුයි.

(ඇ) **අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය පිළිබඳ උපාධියක් ලබා සිටිය යුතුයි.

(ඈ) **සෞඛ්‍ය තත්ත්වය.**—අයදුම්කරුවන් යුද හමුදාවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වය සපුරාලීමට සුදුසුකම් ලබා සිටිය යුතුයි.

(ඉ) **අනන්‍යතාවය ඔප්පු කිරීම.**—අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත්‍ර සහ රථවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වාහන පැදවීමේ බලපත්‍රය පිළිගනු ලැබේ.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම්පත්‍ර තම අත් අකුරින් සකස් කොට, 1973.11.24 දින දහවල් 12ට හෝ ඊට පෙර හෝ ලැබෙන්සේ යුද්ධ හමුදා මූලස්ථානය, තැ. පෙ. 533, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්පත්‍ර බහා ලන කවරයේ වම් උඩ කෙළවරේ “යුද්ධ හමුදාවේ කෘෂිකර්ම නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය” යනුවෙන් සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර භාර ගනු ලබන අවසාන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානය වෙත ලැබෙන අයදුම්පත්‍ර භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍ර නිකුත් කරනු නොලැබේ.

6. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, යම්කිසි නිලධාරියෙකු තෝරා පත් කරගනු ලැබුවහොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුයි. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළහොත්, රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුදා විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම් පතට අමුනා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය.

(ඇ) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්, මෙම සහතික පත් ඉල්ලුම්කරු පුද්ගලිකව දන්නා හඳුනන වගකිවයුතු පුද්ගලයන්ගෙන් මෑතදී ලබා ගත් ඒවා විය යුතුය.

8. ලැබෙන ඉල්ලුම් පත් සංඛ්‍යාව ගැන සලකා බලා, අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත් කර ගැනීම කරනු ලබන්නේ එසේ තෝරා ගත් ඉල්ලුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවන්ට එය පවත්වන ස්ථානය, දිනය හා වේලාවන් ලියා දන්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සඳහා ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු නොලබන ඉල්ලුම්කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9. තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරුවන් විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීති රීති වලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

10. තනතුර විශ්‍රාම වැටුප් සහිත නොවේ. අර්ථ සාධක අරමුදලක් සඳහා තම දායක මුදල් වශයෙන් තම ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක් අඩුකර ගැනීමට තම කැමැත්ත දෙන බවට තෝරා ගනු ලබන අපේක්ෂකයින් විසින් ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු වන්නේය. සේවා විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂික දීමනාවක් දීම පිළිබඳව 1961 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයෙහි ඇති රෙගුලාසි මෙම තනතුර සඳහා අදාල නොවන්නේය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදා ආඥාපති වෙනුවට.

1973 ඔක්තෝබර් 23 දින.

### ශ්‍රී ලංකා බුද්ධ හමුදාවේ කෘෂිකර්ම නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. ජාතිය :————.
   ලාංකිකයකු වූයේ පෙළපතින් ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න.) :————.
3. ලිපිනය :————.
4. උපන් දිනය :————.
   1973.11.24 වැනි දිනට වයස :—
   අවුරුදු :——, මාස :——, දින :——.
5. සම්පූර්ණ නම, උපන් ස්ථානය සහ වත්මන් ලිපිනය :—
   මවගේ :————.
   පියාගේ :————.
6. ඔබ විවාහක ද ? අවිවාහක ද ? :————.
7. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.
8. පාසැලේ දී හෝ. විශ්ව විද්‍යාලයේ දී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :————.
9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයන් හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේ ද :————.
10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :————.
11. මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කළෙහිද ? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද ? :————.
12. ඔබගේ පාසැල් සමග විශ්ව විද්‍යාලය සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—
    පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.
    ඇතුළත් වූ දිනය :————.
    අස් වූ දිනය :————.
    සමර්ථ වූ ප්‍රසිද්ධ පරීක්ෂණය :————.
13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස් වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :—
    ස්වාමි පක්ෂය :————.
    රැකියාවේ ස්වභාවය :————.
    සේවය කළ කාලය :————දින සිට ———— දින දක්වා.
14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :——.
    1. ————.
    2. ————.

මෙම අයදුම් පතෙහි ම විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11–109—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

#### හෙදි තනතුර (කාන්තා)

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ, සුදුසුකම් ලත් හෙදි තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙල කර, 1973.11.30 දිනට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **ඒකාබද්ධ වැටුප්.**—වර්ෂයකට රු. 3,864 න් පටන් ගෙන, රු. 144 බැගින් වූ වාර්ෂික වේතනාධික සහිතව වර්ෂයකට රු. 6,456 ක් දක්වා වැඩිවේ. (රු. 5,736 වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් තිබේ.)

තෝරා ගනු ලබන අයදුම්කාරියන් පහත සඳහන් දැයට හිමිකම් ලැබෙනු ඇත :—

(i) වර්ෂයකට රු. 60 ක ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාවක්,

(ii) වර්ෂයකට රු. 30 ක පාවහන් සඳහා දීමනාවක්, සහ

(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෙදියන්ට නිකුත් කරන ප්‍රමාණයට නොමිලේ නිල ඇඳුම්.

3. **අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කාරියන්ට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(i) 1973.11.30 දිනට වයස අවුරුදු 25 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 40 ට වැඩි නොවිය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ නියුතු අය කෙරෙහි ඉහළ වයස් සීමාව බල නොපානු ඇත.)

(ii) 1949 අංක 10 දරණ වෛද්‍ය (සංශෝධිත) පනත යටතේ සුදුසුකම් ලත් හෙදියන් වශයෙන් ලංකා වෛද්‍ය මණ්ඩලයේ ලියා පදිංචිවූ අය විය යුතුයි. සහ/හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ හෙදියන්ගේ ප්‍රවීණතා සහතිකය දැරිය යුතුය.

හෙදියන්ගේ ප්‍රවීණතා සහතිකයට අමතර වශයෙන් සූතිකා කර්මය පිළිබඳ සහතික දරණ ඉල්ලුම්කාරියන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(iii) මනා චරිතයකින් සහ හොඳ ශරීර සෞඛ්‍යයෙන්ද යුක්ත විය යුතුයි.

**සටහන.**—වෛද්‍ය ආඥපනතේ (105 වැනි අධිකාරයේ) VII වැනි ඡේදය යටතේ වින්නඹු සේවිකාවක් වශයෙන් ලියා පදිංචිවී ඇති හා සුදුසුකම් ලත් හෙදියක් ලෙස අඩු වශයෙන් අවුරුදු දෙකක්වත් සේවය කර ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

4. **බඳවා ගැනීමේ වගන්ති.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලබන අයදුම්කාරිය දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නියක වුවහොත්, ඇයගේ එම හිමිකම වෙනස් නොවනු ඇත.

5. අයදුම්කාරියන් සිය අයදුම්පත්වලට පහත සඳහන් ලියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ.) අමුණා එවිය යුතුයි.

(අ) **උප්පැන්න සහතිකය.**—(සැ. යු.—බෞතිස්ම සහතික හෝ අධ්‍යාපන නීති මාලාව යටතේ පාසැල්වල භාවිතය සඳහා නිකුත් කරනු ලබන ලුහුඩු උප්පැන්න සහතිකය හෝ මේ සඳහා භාරගනු නොලැබේ.)

(ආ) අයදුම්කාරියගේ චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ගෙන් මෙය අවශ්‍ය නොවේ.)

(ඇ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතිකය.

6. ඉල්ලුම් පත් කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, තැ. පෙ. 594, ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලන නිලධාරි වෙත එවිය යුතුයි. මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට ඉල්ලුම් පත් නොඑවිය යුතුයි.

7. රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ ඉල්ලුම් පත් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) ඡේදයේ මුල සළකොට ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා කරන පත්වීම්වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සැළකිල්ලක් යොමු කරවනු ලැබේ.

**සටහන.**—ඉල්ලුම්පත්වලට අමුණා එවන කිසිම ලියවිල්ලක් ආපසු එවනු නොලැබේ. ඉහත සඳහන් සියලුම සුදුසුකම් නොමැති අයදුම්කාරියන්ගේ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සිවිල් පාලන නිලධාරි,
ගුවන් හමුදා අණදෙන නිලධාරි වෙනුවට.

මූලස්ථානය,
ශ්‍රී. ලං. ගු. හ.
තැ. පෙ. 594,
කොළඹ,
1973 ඔක්තෝබර් මස 22 වැනි දින.

### ආදර්ශ ආකෘති පත්‍රය

(1) සම්පූර්ණ නම: (පැහැදිලි අකුරින්) :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය හා වයස (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.) :————.

(4) ජාතිය (ලාංකිකයෙකු වන්නේ පෙළපතින්ද නැතහොත් ලියා පදිංචි වීමෙන්ද යනවග සඳහන් කරන්න) :————.

(5) (අ) විවාහකද අවිවාහකද යන වග :————.

(ආ) විවාහක නම් :
කන්‍යා නාමය :————.

(6) දැනටමත් සේවයේ යෙදී සිටී නම් :—

(අ) දැනට කරන රැකියාව :————.

(ආ) සේවා කාලය අවුරුදු කීයද ? :————.

(7) අධ්‍යාපනය ලැබූ පාසැල් හා සමත් වූ උසස් ම විභාගය:————.

(8) හෙදි පුහුණුව ලැබූ ස්ථානය :————.

(9) සූතිකා කර්මය පිළිබඳව පුහුණුව ලබා ඇතිද යන වග (සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(10) චරිත සහතික ලබාගත්තේ යමෙකුගෙන්ද, ඒ අයගේ නම් හා ලිපිනය (මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක පිටපත් අමුණන්න.) :————.

(11) මීට පෙර රජය යටතේ සේවය කර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර සපයන්න :————.

(12) හෙදියක වශයෙන් ලියා පදිංචිවී ඇති සහතිකයේ අංකය (සහතිකයේ පිටපතක් අමුණන්න.) :————.

මා රජයේ සේවයේ හෝ වෙනත් ආයතනයක සේවයේ අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම නොගන්වන ලද බවද, සේවයෙන් පහ නොකරන ලද බවද, සාපරාධී වරදකට උසාවියකින් වරදකාරියක නොකරන ලද බවද, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් හෝ තොරතුරු අසත්‍ය බව සොයා ගනු ලැබුවහොත් ඊට ලැබෙන දඬුවම, වහාම මා රාජ්‍ය සේවයෙන් පහකිරීම බව මම දනිමි.

————,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

11–58—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

### කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත්වන බෝඹුවල කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත්, බෝඹුවල කොහොලාන, බොලොස්සගම, ගමගොඩ, සේරුපිට, රෙමුනාගොඩ යන ග්‍රාම සේවක කොට්ඨාශ ඇතුළත් බෝඹුවල කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයේ අන්දමට පිළියෙලකරන ලද අයදුම්පත් 1973 දෙසැම්බර් 3 වෙනි දිනට හෝ ඊට පෙර "දිසාපති, කච්චේරිය, කළුතර" යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

(2) මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 ක දීමනාවක් බැගින් ගෙවනු ලබේ.

(3) **සුදුසුකම් :**—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා 60ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම .

(ඇ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VIII වන ප්‍රමාණයෙන් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සංස්ථා හා පළාත් පාලන සේවකයින්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත් භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

පී. ජී. පුංචිහේවා,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේදීය.

### ආදර්ශ අයදුම් පත්‍රය

**කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත් වන බෝඹුවල කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.
4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.
   (ආ) උපන් දිනය සහ ස්ථානය :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. මීට පෙර රැකියාවක් කෙළේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.
10. ඉල්ලුම්කරු ණය ගැතිව සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11–68—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

### කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත්වන යෝජිත නැබොඩ ගම්සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත්, ඉද්දගොඩ, පහල නැබොඩ, තෙබුවන, පැලපිටියගොඩ යන ග්‍රාම සේවක කොට්ඨාශ ඇතුලත් යෝජිත නැබොඩ ගම් සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත් 1973 දෙසැම්බර් 3 වෙනි දිනට හෝ ඊට පෙර "දිසාපති, කච්චේරිය, කළුතර" යන ලිපිනයට ලැබෙනසේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. **සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 30ට නොඅඩු හා 60ට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඇ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VIII වන ප්‍රමාණයෙන් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සංස්ථා සහ පළාත් පාලන සේවකයින්ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ද මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම්පත් භාර ගනු නො ලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපැලෙන් එවිය යුතුය.

පී. ජී. පුංචිහේවා,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ඔක්තෝබර් මස 15 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

**කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරළය බටහිර ප්‍රා. උ. දි. කොට්ඨාශයට අයත් වන යෝජිත නැබොඩ ගම් සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. සථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කෙළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොළවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණය ගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11–69—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

**මහා භාණ්ඩාගාරය**

සහකාර අධ්‍යක්ෂ තනතුරු (සංස්ථා අංශය)

මහා භාණ්ඩාගාරයේ, සංස්ථා අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මේ නිවේදනයට යාකොට ඇති ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කලයුතු වන අයදුම් පත් 1973 නොවැම්බර් මස 19 දිනට පෙර, මුදල් අමාත්‍යාංශයේ ලේකම් (මධ්‍යම ශාඛාව), තැ. පෙ. 500, කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරෙහි ' සහකාර අධ්‍යක්ෂ, සංස්ථා අංශය " යන්න පැහැදිලි ලෙස සඳහන් කල යුතුය.

සටහන.—ඉල්ලුම් පත්‍රය තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලීමට නොපිළිවන. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳදරා ගනු ලැබිය යුතුය.

2. වැටුප් හා දීමනා.—ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිත පදනමක් පිට, විවාහක දීමනාවද, සමඟ වර්ෂයකට රුපියල් 11,040—11×480—රු. 16,320 වැටුපක්. ද්විතීයනය කෙරෙන සංස්ථාවල නිලධාරීන් ඔවුන්ගේ සංස්ථා වැටුප් මත.

**(තෝරාගනු ලැබූ අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඔහු වැටුප් පරිමාණයේ පියවරක තැබිය හැකිය.)**

3. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින් ම--

(අ) ඔහු/ඇය විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්තව සිටින බවටද,

(ආ) 1973 නොවැම්බර් මස 19 වැනි දිනට වයස අවුරුදු 23 ට නො අඩු හා අවුරුදු 35 ට වැඩි නොවන බවටද, සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතු ය.

(දැනටමත් රජයේ සේවයෙහි නියුක්තව සිටින අයදුම් කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපානු ඇත.)

(ඇ) අධ්‍යාපන සුදුසුකම් :

(i) ලංකාවේ/එංගලන්තයේ/වේල්සයේ වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් සමත් වීම, හෝ

(ii) එංගලන්තයේ පිරිවැය හා වැඩ පිළිබඳ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වීම.

රජයේ දෙපාර්තමේන්තුවක හෝ වාණිජ්‍ය හෝ කාර්මික ආයතනයක පහත සඳහන් ක්ෂේත්‍රයන් ඇතුළත් වන විධායක ශ්‍රේණියක පළපුරුද්ද, තනතුර සඳහා සුදුසු වූවායින් පසු ලබා තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත:—

(අ) මුදල් පරිපාලනය, විමර්ශනය හා කළමනාකාරිත්වය,

(ආ) ගණන් තැබීම, පිරිවැය තැබීම හා කළමනාකාරිත්වය පිළිබඳ සවිස්තර ක්‍රම සම්පාදනය,

(ඇ) යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම හා මිල නියම කිරීම.

4. පහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ සියල්ලම, ඉල්ලා සිටි විටක ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානමින් සිටිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය (අධ්‍යාපන රෙගුලාසි සංග්‍රහයේ ප්‍රකාර උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරනු ලබන උප්පැන්න සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් විභාග පිළිබඳ සහතික.

සටහන :

(I) ඉල්ලුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

(II) ඉල්ලා සිටි විටෙක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

5. රාජ්‍ය සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කර සිටිනු ලැබිය යුතුය.

6. ඉල්ලුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියකියවිල්ලක් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

7. ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ, ගාලු මුවදොර,
මහලේකම් කාර්යාලයේ,
මුදල් අමාත්‍යාංශයේ දීය.

**ඉල්ලුම් පත්‍ර ආකෘතිය**

1. ඉල්ලුම් කරන තනතුර :————.

2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

3. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දැනුම් දිය යුතුය) :————.

4. උපන් දිනය :——, වර්ෂය :——, මාසය :——, දිනය :——.

5. ඉල්ලුම්පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :— වර්ෂ :——, මාස :——, දින :——.

6. ඔබ ලංකා පුරවැසියෙක්ද? පාරම්පරික රටවැසියෙක්ද, එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක්ද, යන බව සඳහන් කරන්න. (සටහන අංක (1) බලන්න) :————.

7. උපන් ස්ථානය (සටහන අංක (2) බලන්න) :————.
   (අ) ඉල්ලුම්කරුගේ :————.
   (ආ) පියාගේ :————.
   (ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
   (ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
   (ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක් ද, වැන්දඹුවකද යන බව :————.

9. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :————.
   (1) සිංහල :————.
   (2) දෙමළ :————.
   (3) ඉංග්‍රීසි :————.

10 අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පංතියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න.) :————.

11. දැනට නිරත රක්ෂාව සහ ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් (රක්ෂාවලට බැඳුනු දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න) :————.

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| ............ | ..................... | | .................................... |
| ............ | ..................... | | .................................... |
| ............ | ..................... | | .................................... |
| ............ | ..................... | | .................................... |
| ............ | ..................... | | .................................... |
| ............ | ..................... | | .................................... |
| ............ | ..................... | | .................................... |
| ............ | ..................... | | .................................... |

සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහළ 13 කොටුවෙහි සඳහන් කළ යුතු ය.

12. විශේෂ සුදුසුකම්.—(දන්වීමෙහි දැක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේ ද? එසේ ඇතොත් දින යන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න.) :————.

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරාගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස් සැකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11-95—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

### පුරප්පාඩු

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**උපාධිධාරි පරිවර්තක (සිංහල)—III ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කරුවන් විෂයයක් වශයෙන් සිංහල සමග පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක හෝ වෙනත් පිළිගත් ආයතනයක නැතහොත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්/සංස්ථාවක් හෝ වෙනත් පිළිගත් ආයතනයක් වෙනුවෙන් අවම වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

වයස් සීමාව.—ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනට වයස අවුරුදු 45 ට අඩුවිය යුතුය.

වැටුප් පරිමාණය.—රු. $\frac{485\text{—රු. } 965}{8\times30\text{—}6\times40}$

මාසික මූලික වැටුපක් සහ බැංකු පරිමාණයන්ට අනුව දීමනා.

රු. 805 ඉක්මවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වනු ඇත.

**සහකාර නීති නිලධාරීන්—IV ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්.**—(අ) එක් අවුරුද්දකට නො අඩු සක්‍රිය සේවා පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු සහ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු විය යුතුය.

(ආ) ඊට අමතරව, අයදුම්කරුවන් විසින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී එකම පෙනී සිටීමකදී යටත් පිරිසෙයින් සිංහල හෝ දෙමළ සහ ඉංග්‍රීසි යන විෂයයන්හි සම්මාන සාමාර්ථය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව.**—ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනට වයස අවුරුදු 35 ට අඩුවිය යුතුය.

වැටුප් පරිමාණය.—රු. $\frac{305\text{—රු. } 675}{8\times15\text{—}10\times25}$

මාසික මූලික වැටුපක් සහ බැංකු පරිමාණයන්ට අනුව දීමනා.

රු. 575 ඉක්මවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වනු ඇත.

**සියලු තනතුරුවලට අදාල සාමාන්‍ය කොන්දේසි :**

(i) තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගනු ලැබූ අපේක්ෂකයින් විසින් දළ වැටුපෙන් 6% ක් අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය. බැංකුවේ දායක මුදල 9% ක් වේ.

(ii) පත්වීම් අවුරුදු තුනක පරිවාස කාලසීමාවකට යටත් වේ. රාජ්‍ය හෝ සංස්ථා සේවයේ සෑහෙන සේවා කාලයක් සහිත වූ අපේක්ෂකයකු තෝරාගනු ලැබේ නම්, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එබඳු අපේක්ෂකයකු කෙටි වූ පරිවාස කාලයක් මත පත්කරනු ලැබේ.

(iii) සෑම අපේක්ෂකයකු විසින් ම ඔහු/ඇය
   (අ) විශිෂ්ඨ චරිතයෙන් හා ශරීරික සෞඛ්‍යයෙන් යුතු බව
   සහ
   (ආ) අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද ඇති අයකු බවට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(iv) තමාගේ නම සහ ලිපිනය ලියූ 8"×4" ප්‍රමාණයට වඩා කුඩා නොවූ, මුද්දරයක් සහිත කවරයක් බැංකුවේ සේවක මණ්ඩල නිලධාරි වෙත එවීමෙන් ලබාගන්නා ෆෝර්ම මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(v) අයදුම්පතක් හෝ අදාල ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙහා කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

(vi) තෝරාගනු ලැබූ අපේක්ෂකයින් විසින්
   (අ) දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීම සඳහා ඔවුන් ශාරීරික වශයෙන් සුදුසුද යන බව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීම.
   (ආ) අංක 33 දරන 1956 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානයන්ට සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීම සඳහා දැනට පනවා ඇති හෝ මින් ඉදිරියට පනවනු ලබන ඕනෑම නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම.
   (ඇ) බැංකුව විසින් නිගමනය කරනු ලබන ප්‍රමාණයට හා ආකරයට ඇප මුදල් සැපයීම.
   (ඈ) ශ්‍රී ලංකා ජනරජයට පක්ෂපාතීත්ව දිවුරුමක් හා රහස්‍යතා දිවුරුමක් අත්සන් තැබීම කළ යුතුය.

(vii) නියමිත පරිදි සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පත් 1973 නොවැම්බර් මස 23 වන දිනට පෙර ලැබෙන පරිදි, සේවක මණ්ඩල නිලධාරී, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, 'ඉතිරිකිරීමේ මන්දිරය', කොළඹ 3. වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සාමාන්‍යාධිකාරී,
ජාතික ඉතිරිකිරීමේ බැංකුව.

කොළඹ 3.
1973 ඔක්තෝබර් 24 දින.

11-124—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### නාවින්නේ ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ තනතුර

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, නාවින්නේ ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත සඳහන් ආකෘතිපත්‍රයට අනුව පිළියෙල කළ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1973.11.23 වැනි දා.

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1973.11.30 වැනි දා.

සටහන් :—

(i) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන්, තම ඉල්ලුම් පත්‍ර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු:—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ශ්‍රී ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙති.

2. සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි :—

(i) මෙම තනතුරු තාවකාලික ය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නොලැබේ.

3. වැටුප් ක්‍රමය.—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය.—වර්ෂයකට රු. 18,840—600 × 2—රු. 20,040 කි. (1969.10.01 දිනට පෙර පැවැති අනුරූප මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 15,600—600 × 2—රු. 16,800 කි.)

4. අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1973.11.2 දිනට වයස අවුරුදු 35 ට නොඅඩු වියයුතු අතර, අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

(සී) (i) පිළිගත් ආයුර්වේද විද්‍යාලයක පළමුවෙනි පන්තියේ ගෞරව ඩිප්ලෝමා සහතිකයක් හෝ ; පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව, සත්ව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව පිළිබඳ පළමුවැනි හෝ දෙවැනි පන්තියේ ගෞරව උපාධියක් ලබා තිබීම.

(ii) ගෞරව පන්තියේ උපාධි තත්ත්වයක හෝ ප්‍රාචීන පණ්ඩිත තත්ත්වයක සංස්කෘත දැනුමක් තිබීම.

(iii) ආයුර්වේද පර්යේෂණය පිළිබඳව විශිෂ්ට සේවයක් කර තිබීම.

(iv) පරිපාලනය පිළිබඳ පුළුල් පළපුරුද්දක් තිබීම.

සටහන : පිළිගත් ආයුර්වේද ආයතනයක වෛද්‍යවරයෙකු වශයෙන් හෝ කථිකාචාර්යවරයෙකු වශයෙන් හෝ තනතුරු දෙකේම හෝ අවුරුදු 15 කට නොඅඩු පළපුරුද්දක් ඇති ඉල්ලුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිළි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතු ය :—

(ඒ) උප්පැන්න සහතිකය.—(සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස් ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිළධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වන ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

සී. ඊ. ඇස්. වීරතුංග,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

1973 ඔක්තෝබර් මස 20 දින දී,
කොළඹ 1, ගාලු මුවදොර,
මහාලේකම් ගොඩනැගිල්ලේ,
සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

අංකය : ..........................................
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

**ඉල්ලුම් පත්‍ර පෝරමය**

1. ඉල්ලුම් කරන තනතුර :

.................................................. තනතුර

.................................................. දෙපාර්තමේන්තුව

2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්)

3. තැපැල් ලිපිනය
(ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දනුම් දිය යුතුය)

4. උපන් දිනය

වර්ෂය මාසය දිනය

..................................................

6. ඔබ ලංකා රටවැසියෙක්ද ? පාරම්පරික රටවැසියෙක් ද එසේ නැත හොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න. (සටහන අංක (i) බලන්න)

5. දේශීය ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :

වර්ෂ මාස දින

..................................................

7. උපන් ස්ථානය (සටහන අංක (2) බලන්න)
(අ) ඉල්ලුම්කරුගේ :..................................................
(ආ) පියාගේ : ..................................................
(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :..................................................
(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :..................................................

8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :
..................................................
(ආ) ඔබ විවාහකද ? අවිවාහකද ?
වැන්දඹුවෙක්ද, වැන්දඹුවක ද යන බව
..................................................

9. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :
(1) සිංහල (2) දෙමළ (3) ඉංග්‍රීසි
(1) ..................................................
(2) ..................................................
(3) ..................................................

10. වයස අවුරුදු 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලා සහ වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| (1) .................. | .......... | .......... | (1) .................. | .......... | .......... |
| (2) .................. | .......... | .......... | (2) .................. | .......... | .......... |
| (3) .................. | .......... | .......... | (3) .................. | .......... | .......... |
| (4) .................. | .......... | .......... | (4) .................. | .......... | .......... |

11. ක්‍රීඩා පිළිබඳව ලබා ඇති විශිෂ්ටත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර

12. (ඒ) ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද ? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද ?

(බී) ඔබ සාපරාධි වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක්ද ? එසේ නම්, දිනයන් සහ නඩු අංකය සමඟ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

13. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ට සමර්ථ වෘත්තීය හා කාර්මික සුදුසුකම් වල විස්තර, ඒවායේ දින, පංතියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නාලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතන වල නම් සඳහන් කරන්න)

14. "දැනට නිත්‍ය රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල්
(රක්ෂාවට බැඳුනු දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න)
**සැලකිය යුතුයි :** ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහළ 16 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| (1) .................. | .......... | .......... | .......... |
| (2) .................. | .......... | .......... | .......... |
| (3) .................. | .......... | .......... | .......... |
| (4) .................. | .......... | .......... | .......... |
| (5) .................. | .......... | .......... | .......... |
| (6) .................. | .......... | .......... | .......... |
| (7) .................. | .......... | .......... | .......... |
| (8) .................. | .......... | .......... | .......... |

15. **විශේෂ සුදුසුකම් :** (දැන්වීමෙහි දක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද ? එසේ ඇතහොත් දිනයන් ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න)

---

16. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :

---

17. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

දිනය :.......................................... ..............................................., ඉල්ලුම්කරුගේ අත්සන.

---

සටහන් :—(1) ඔබ ලංකාවේ රට වැසියකු වී සිටින්නේ ලියාපදිංචිවීමෙන් නම්, ඔබට නිකුත් කරන ලද රටවැසි සහතිකයේ යොමු අංකය සහ දිනය සඳහන් කරන්න.

(2) ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඈ) හෝ පිරවිය යුතුයි.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :—

දිනය :............ ..............................................., දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ පදවි නාමය.

11–78—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

III වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති III වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කළයුතු අයදුම්පත් 1973.11.24 දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. කවරයේ උඩ වම් කෙළවරේ "III වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය. පත්වීම් අර්ථ සාධක අරමුදල් ක්‍රමය යටතේ වනු ඇත. පත්කරනු ලබන අය විසින් තමාගේ වැටුපෙන් සියයට 6 ක් අර්ථ සාධක අරමුදල සඳහා දායක මුදල් වශයෙන් ගෙවිය යුතු අතර, රජය විසින් සියයට 9 ක් ඒ සඳහා ගෙවනු ඇත. පත්වීම් සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු පරිවාස කාල සීමාවකට යටත් වේ.

3. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත දක්වෙන සුදුසුකම් ලබා සිටින බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1973.11.24 දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා 35 ට නොවැඩි බව (දැනටමත් රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ii) විශිෂ්ට චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව ;

(iii) පහත දක්වෙන අධ්‍යාපන සුදුසුකම් දෙක අතරින් එකක් ඇති බව: —

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ; හෝ

(ආ) දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය ඇතුළු විෂයයන් 6 කින් ලද (සාමාන්‍ය පෙළ) අධ්‍යයන පොදු සහතික පත්‍රය ;

සහ

(iv) පහත දක්වෙන වෘත්තීය සුදුසුකම් තුන අතරින් යටත්පිරිසෙයින් එකක්වත් ලබා සිටින බව :—

(අ) ලංකා පුස්තකාල සංගමයේ මධ්‍ය පරීක්ෂණය ; හෝ

(ආ) කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යා ඩිප්ලෝමා සහතිකය ; හෝ

(ඉ) සමාන සුදුසුකම්.

(v) අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක පුස්තකාලයාධිපතිවරයකු වශයෙන් පළපුරුද්දක් තිබිය යුතුයි.

4. **වැටුප් ක්‍රමය.**—රුපියල් 6,600 කින් ආරම්භ වී, රු. 180 වාර්ෂික වැඩිවීම් 8 කින් රු. 8,040 දක්වා වැඩිවන ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අයත් වේ. (1969.10.01 ට පෙර මීට අනුරූපව පැවැති වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,900—8 × 180—5,340 විය.)

5. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත 1 ඡේදයේ සඳහන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නො ලැබේ. එහෙත්, දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියමිත දිනයට පෙර ලැබී ප්‍රමාදය පිළිබඳව සැලකිය යුතු කරුණු ඔහු විසින් ඉදිරිපත් කළහොත් පමණක්, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වුවද, සෑම අයදුම්කරුවෙකු විසින්ම තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නියමිත දිනට පෙර ලැබෙන පරිදි කෙළින්ම මේ අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

6. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) අයදුම්පත්වලට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතික හෝ පාඨශාලාවන්ට ඇතුළත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතික භාර ගනු නො ලැබේ.)

(ආ) අධ්‍යාපන සහතික,

(ඉ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 2 ක් (දැනට රජයේ ස්ථිර සේවයේ සිටින අයදුම් කරුවන් විසින් මේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

7. අයදුම්පත් හා ඊට අදාල වෙනත් ලිපි මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ නිල ලිපිනයට හැර කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදුකොන්දේසි කෙරෙහි ද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ගෙවුණු කල, අයදුම්පත ලද බවට දැන්වීමක් නොලද හොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත වහාම දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාව පැහැර හැරියහොත්, තම අයදුම් පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමි වනු ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් 8½ × 13½ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය)

**අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි III වැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුර**

1. නම (මුලකුරු සහිතව) :————.

මහතා/මහත්මිය/මෙනෙවිය

2. සම්පූර්ණ නම :————.

3. රාජකාරි ලිපිනය :————.

4. පෞද්ගලික ලිපිනය :————.

5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.
(ආ) එසේ නම් පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද ?:————.

6. උපන් දිනය :
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස :—
අවුරුදු :————. මාස :————. දින :————.

8. දැනට ලබන තනතුර පිළිබඳ විස්තර :

(අ) තනතුර :————.

(ආ) ස්ථිරද, තාවකාලිකද ? :————.

(ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :————.

(ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.

(උ) දෙපාර්තමේන්තුව :————.

(ඌ) ආයතනය/සේවා ස්ථානය :————.

(එ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.

(ඒ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.

9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :—

| විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

10. වෘත්තිය සුදුසුකම් පිළිබඳ විස්තර :

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන :—

| ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |

12. පුස්තකාලයාධිපති ලෙස පළපුරුද්ද :—

| ආයතනය | දෙපාර්තමේන්තුව | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

13. කලින් දැරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු පිළිවෙලට සඳහන් කරන්න.)

| දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර | ස්ථිරද තාවකාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| | | | | | |

14. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේද? (එසේ නම් විස්ත දක්වන්න) :————.

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේ ද? (එසේ නම් විස්තර දක්වන්න) :————.

16. ඔබ මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම් ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුව හොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11–126—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

අංකය : සාප 7/114.

### අධ්‍යාපන අමාත්‍යාංශය

### බහු තාක්ෂණික ආයතනයන්හි වාණිජ විද්‍යාව පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශයේ, බහුතාක්ෂණික ආයතනයන්හි වාණිජ විද්‍යාව පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පසතින් දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1973 නොවැම්බර් මස 23 දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම් පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "බහුතාක්ෂණික ආයතනයන්හි වාණිජ විද්‍යාව පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය " යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි:—** තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයින් දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයන් වනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන්නෝ නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයින්, දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම්, මුල් වතාවේ, තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලී ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

3. **වැටුප් හා දීමනා:—** රු. 6,720ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 360 ක් වාර්ෂික වැටුප් වැඩිවීම් 12කින් රු. 11,040 දක්වා නගින ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අදාල වේ (මීට අනුරූපව, 1969.10.01 දිනට පෙර පැවැති වාර්ෂික වැටුප් ක්‍රමය රු. 4,080—12 × 360—8,400 ක් විය)

4. **අවශ්‍ය සුදුසුකම්.—** සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1973.11.23 වැනි දිනට තමාගේ වයස අවුරුදු 26 ට නො අඩු හා අවුරුදු 45 ට නොවැඩි බව (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදළ නොවේ.)

(ඕ) (1) (ඒ) පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සටහන.**—අපේක්ෂකයින් උපාධි පරීක්ෂණයේදී පහත සඳහන් විෂයයන් ගෙන් යටත්පිරිසෙයින් හතරකින්වත් සමත්වී තිබිය යුතුය :-

(1) ආර්ථික විද්‍යාව (ව්‍යවහාරික ආර්ථික විද්‍යාව සහ ආර්ථික විද්‍යා ඉතිහාසයද ඇතුළත්වේ.) (2) ගණකාධිකරණය. (3) සංඛ්‍යා ලේඛනය විද්‍යාව. (4) සාමාන්‍ය වාණිජ හා මූල්‍ය දැනීම. (5) විගණනය. (6) රාජ්‍ය මූල්‍ය. (7) පරිපාලන මූලධර්ම සහ පරිචය. (8) අලෙවිකරණය. (9) සමාජ විද්‍යාව. (10) පිරිවැය ගණකාධිකරණය. (11) මූල්‍ය ආර්ථික විද්‍යාව. (12) ව්‍යාපාර පරිපාලනය.

හෝ

(බී) ලංකා කාර්මික විද්‍යාලයයේ වාණිජ ඩිප්ලෝමා සහතිකය.

(2) අවුරුදු 5 කට නොඅඩු කාලයක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

(ඩී) සිංහල මාධ්‍ය බහුතාක්ෂණික ආයතනවල තනතුරු සඳහා අයදුම් කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබිය යුතු අතර දෙමළ මාධ්‍ය බහුතාක්ෂණික ආයතනයෙහි තනතුරු සඳහා අයදුම්කරුවන්ට දෙමළෙන් වැඩකිරීමට මනාදැනුමක් තිබිය යුතුය. ප්‍රවීණතාවය නොමැති අයදුම්කරුවන් පත්වීමේ දින සිට අවුරුදු 3 ක කාලයක් ඇතුළත සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව පිළිබඳ (අදාලවිය හැකි පරිදි) නියමිත තත්ත්වයක ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

**සටහන.**—විශ්ව විද්‍යාලයක හෝ සමාන තත්ත්වයේ ආයතනයක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අපේක්ෂකයින් කෙරෙහි හා ඉහත සඳහන් සුදුසුකම් ඇති අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික ආයතනයන්හි සේවයේ සිටින අපේක්ෂකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතු ය :-

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසල් ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික ;

(සී) චරිත සහතික දෙකක්, (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්‍යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතු ය)

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ.යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිළධාරීන් විසින් එවනු ලබන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම්පත් භාරගනු නො ලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවේ ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් නොකළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වුවද සෑම අයදුම්කරුවකු විසින්ම තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් නියමිත දිනට පෙර ලැබෙන පරිදි කෙලින්ම මේ අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිළධාරියෙකුගේ පුද්ගලික නමට නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධ ඉයන් අදාල වන [illegible] කොන්දේසි කෙරෙහි ද අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් මේ කාර්‍යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973.10.24 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

අංකය : සාප 7/114.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

(අහල් 8½ × 13½ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය)

**අධ්‍යාපන අමාත්‍යාංශයේ බහුතාක්ෂණික ආයතනයන්හි වාණිජ විද්‍යාව පිළිබඳ II ශ්‍රේණියේ කථිකාචාර්‍ය තනතුර**

1. නම (මුලකුරු සහිතව) :————මහතා/මිය./මෙනවිය.
2. සම්පූර්ණ නම :————.
3. රාජකාරි ලිපිනය :————.
4. පෞද්ගලික ලිපිනය :————.
5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.
   (අ) එසේ නම්, පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන් ද ?————.
6. උපන් දිනය : අවුරුද්ද————මාසය :———— දිනය :————.
7. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයට වයස :— අවුරුදු———— මාස————දින————.
8. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :—
   (අ) තනතුර :————.
   (ආ) ස්ථිරද, තාවකාලිකද ? :————.
   (ඉ) විශ්‍රාම වැටුප් සහිතද, රහිතද ? :————.
   (ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.
   (උ) දෙපාර්තමේන්තුව :————.
   (ඌ) ආයතන/සේවා ස්ථානය :————.
   (එ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.
   (ඒ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.
9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල ප්‍රවීණතාවය/දෙමළ භාෂාව පිළිබඳ ලබා ඇති සහතිකද ඇතුළත්ව.)

| විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| 1. ———— | ———— | ———— |
| 2. ———— | ———— | ———— |
| 3. ———— | ———— | ———— |
| 4. ———— | ———— | ———— |

10. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :—

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. ———— | ———— | ———— | ———— |
| 2. ———— | ———— | ———— | ———— |
| 3. ———— | ———— | ———— | ———— |
| 4. ———— | ———— | ———— | ———— |
| 5. ———— | ———— | ———— | ———— |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතනය :-

| ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. ———— | ———— | ———— | ———— |
| 2. ———— | ———— | ———— | ———— |
| 3. ———— | ———— | ———— | ———— |
| 4. ———— | ———— | ———— | ———— |
| 5. ———— | ———— | ———— | ———— |
| 6. ———— | ———— | ———— | ———— |
| 7. ———— | ———— | ———— | ———— |

12. වෘත්තීය අධ්‍යාපනය ලද ආයතන :—

| ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— |

13. කලින් දැරූ තනතුරු (නියම දිනයන් දක්වමින් හරියටම [illegible] පිළිවෙලට සඳහන් කරන්න.)

| දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර | ස්ථිරද, තාවකාලිකද | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| ———— | ———— | ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— | ———— | ———— |
| ———— | ———— | ———— | ———— | ———— | ———— |

14 කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරු වී ඇත්තේ ද ? (එසේ නම්, විස්තර දක්වන්න.)————.

15. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබෙද ? (එසේ නම් විස්තර දක්වන්න.)————

16. ඔබ මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම් ඔබේ ණයතුරුස් වල ප්‍රමාණය කොපමණ ද ?————.

17. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස් සකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11–128—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

### දුම්රිය නියෝජිත (බාහිර) තනතුර—කැප් පිටිපොල

මෙම දෙපාර්තමේන්තුවේ කැප් පිටිපොල නියෝජ්‍යස්ථානයේ නියෝජිත (බාහිර) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අඩුම කොමිස් දීමනාව රු 160 කි.

අයදුම් කළ හැක්කේ පිරිමි අපේක්ෂකයින්ට පමණකි. ඔවුන් මෙම නියෝජ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පදිංචිකරුවන් හෝ එහි නිත්‍ය අයිතිවාසිකම් ඇත්තවුන් හෝ පලාත් වාසීන් විය යුතුය. එසේම ඔවුන් අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හෝ 40 ට නොවැඩි වුවන් විය යුතුය.

අයදුම්කරුවන් යටත් පිරිසෙයින් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ අංක ගණිතය/ගණිතය /වාණිජ අංක ගණිතය යන විෂයයන් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් සමත්ව සිටිය යුතුය.

කොළඹ 10, මරදානේ, ලංකා දුම්රිය සේවයේ, දුම්රිය සාමාන්‍යාධිකාරි වෙතින් ලබා ගත හැකි ඉල්ලුම් පත් නිසි පරිදි සම්පූර්ණ කර 1973. 11. 20 වැනි දිනට හෝ ඊට පෙර ඔහු වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. මෙම දිනට පසු ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලබා ගැනීම සඳහා සෑම අයදුම්කරුවකු විසින් ම 9″×4″ ප්‍රමාණයේ මුද්දර නොගැසූ තම ලිපිනය ලියන ලද ලියුම් කවරයක් එවිය යුතුය. පිටත කවරයෙහි "දුම්රිය නියෝජිත (බාහිර) තනතුර—කැප් පිටිපොල සඳහා අයදුම්පත" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

තව දුරටත් විස්තර අවශ්‍ය නම්, දුම්රිය සාමාන්‍යාධිකාරි තැනගේ කාර්යාලයෙන් හෝ ප්‍රදේශයේ ප්‍රසිද්ධ ආයතනයන්හි පළ කෙරෙන දැන්වීම් මගින් ලබා ගත හැකිවනු ඇත.

වී. ති. නවරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

11–97/1—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

### දුම්රිය නියෝජිත (ගමනාගමන) තනතුර—හීල්ඔය

ප්‍රධාන මාර්ගයේ බණ්ඩාරවෙල සහ ඇල්ල යන දුම්රිය ස්ථාන අතර පිහිටුවා ඇති හීල්ඔය නියෝජ්‍යස්ථානයේ නියෝජිත (ගමනාගමන) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අඩුම කොමිස් දීමනාව රු. 160 කි.

අයදුම් කළ හැක්කේ පිරිමි අපේක්ෂකයින්ට පමණකි. ඔවුන් මෙම නියෝජ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පදිංචිකරුවන් හෝ එහි නිත්‍ය අයිතිවාසිකම් ඇත්තවුන් හෝ පලාත් වාසීන් විය යුතුය. එසේම ඔවුන් අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හෝ 40 ට නොවැඩි වුවන් විය යුතුය.

අයදුම්කරුවන් යටත් පිරිසෙයින් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සහ අංක ගණිතය/ගණිතය /වාණිජ අංක ගණිතය යන විෂයයන් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් සමත්ව සිටිය යුතුය.

කොළඹ 10, මරදානේ, ලංකා දුම්රිය සේවයේ, දුම්රිය සාමාන්‍යාධිකාරි වෙතින් ලබාගත හැකි ඉල්ලුම් පත් නිසි පරිදි සම්පූර්ණ කර 1973. 11. 20 වැනි දිනට හෝ ඊට පෙර ඔහු වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. එදිනට පසු ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලබා ගැනීම සඳහා සෑම අයදුම්කරුවකු විසින් ම 9″×4″ ප්‍රමාණයේ මුද්දර නොගැසූ තම ලිපිනය ලියන ලද ලියුම් කවරයක් එවිය යුතුය. පිටත කවරයෙහි වම් පස මුදුනෙහි "දුම්රිය නියෝජිත (ගමනාගමන) තනතුර—හීල්ඔය සඳහා අයදුම් පත" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවේ.

තව දුරටත් විස්තර අවශ්‍ය නම්, දුම්රිය සාමාන්‍යාධිකාරි තැනගේ කාර්යාලයෙන් හෝ ප්‍රදේශයේ ප්‍රසිද්ධ ආයතනයන්හි පළ කෙරෙන දැන්වීම් මගින් ලබා ගත හැකිවනු ඇත.

වී. ති. නවරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

11–79/2—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## වී අලෙවි මණ්ඩලය

### සහකාර සහල් මෝල් ඉංජිනේරු—IV වැනි ශ්‍රේණිය

ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් 1973 නොවැම්බර් මස 16 වැනි දිනට පෙර කොළඹ 5, එලිබෑන්ක් පාරේ අංක 5 දරණ ස්ථානයේ පිහිටි වී අලෙවි මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර අධ්‍යාපනික, වෘත්තීය හා උපතේ නිවැරදිභාවය පිළිබඳ සහතිකවල පිටපත්ද ඒ සමඟ එවිය යුතුය. අයදුම්පත් යවන ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ "සහකාර සහල් මෝල් ඉංජිනේරු තනතුර සඳහා ඉල්ලුම් පත" යනු සඳහන් කළ යුතුය.

1. අවශ්‍ය සුදුසුකම්.—(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා උපාධිධරයෙකු හෝ කෘෂිකර්ම විද්‍යා ඉංජිනේරු උපාධිධරයෙකු විය යුතුය.

2. වැටුප් ක්‍රමය.—රු. 800—10×40, 6×50—රු. 1,500 සියලු දීමනා සමඟ මසකට,

3. වයස.—ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

4. සෙසු කොන්දේසි.—(අ) ලාංකිකයෙක් විය යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය මත ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා සියලුම නීති රීති හා ව්‍යවස්ථා වලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථා වලටත් යටත් වනු ඇත.

(ඉ) රජයේ සේවයේ හෝ සංස්ථා සේවයේ යෙදී සිටින්නවුන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍ර දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් එවිය යුතුය.

1973 සැප්තැම්බර් මස 25 වෙනි දින,
අංක 5, එලිබෑන්ක් පාර,
කොළඹ 5.

සභාපති,
වී අලෙවි මණ්ඩලය.

11–139—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලය

### තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලයේ පහත දැක්වෙන තනතුර සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දැක්වෙන ආකෘතියකට අනුව පිළියෙල කොට 1973 නොවැම්බර් 13 දින හෝ ඊට පෙර "පුවත් පත් කොමසාරිස්, ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලය, 46, ග්‍රෑගරි පාර, කොළඹ 7" යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "සහකාර කොමසාරිස් තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යි යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදල් [illegible] යිම්ය. මෙම තනතුරුවලට පත් කරනු ලබන්නේ අවුරුදු [illegible] පරිවාස කාල සීමාවකට යටත් වය.

සෑම ඉල්ලුම්කරුවකුම තමා ඉල්ලන තනතුරට නියමිත සුදුසුකම් ලබා ඇති බවට සහතික ඉදිරිපත් කළ යුතු වන්නේය. ඉල්ලුම් පත්‍රය සමග පහත දැක්වෙන සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය :—

1. උප්පැන්න සහතිකය,
2. උසස් අධ්‍යාපන සහතික,
3. මෑතකදී ලබා ගත් චරිත සහතික තුනක්.

(රජයේ සේවකයන් චරිත සහතික ඉදිරිපත් කළ යුතු නැත. මුත් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් නිර්දේශ කොට තිබිය යුතුය.)

මෙම ගැසට් පත්‍රයේ පළමුවන කොටසේ (II අ) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

කේ. ජේ. සී. විජයවර්ධන,
පුවත් පත් කොමසාරිස්.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,
46, ග්‍රෑගරි පාර,
කොළඹ 7,
1973.10.27.

### ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලයේ සහකාර කොමසාරිස් තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ නම :————.
   අගට යෙදෙන නම :————.
   අනෙක් නම් :————.
2. ලිපිනය :————.
3. වයස :————.
   (1) අවුරුදු (1973.10.31 දිනට) :————.
   (2) උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
4. ජාතිය :————.
5. විවාහක/අවිවාහක බව :————.
6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
   1. ————.
   2. ————.
   3. ————.
   4. ————.
7. පාඨශාලාවෙන් අස් වූ පසු කළ රැකියා/හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.
8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතු :————.
9. සාපරාධී වරදකට උසාවියකින් කෙදිනක හෝ දඬුවම් විඳ තිබේ නම් වරද හා දඬුවමේ විස්තර :————.
10. චරිත සහතික ලබාගත් පුද්ගලයන්ගේ නම් ගම හා පදිංචි නාම :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි හෝ බව මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත් මගේ අපේක්ෂකත්වය අහිමි වන බවත් පත් කිරීමෙන් පසුව හෙළි වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවටත් එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන,

දිනය :————.

**තනතුර.**—සහකාර පුවත්පත් කොමසාරිස් (තනතුරු 1 යි).

**වැටුප් ක්‍රමය.**—මාසික (සියලු දීමනා ඇතුලුව) රු. 1,000—10×50—රු. 1,500. තෝරා ගනු ලබන අයදුම්කරුගේ පළපුරුද්ද හා හැකියාව අනුව ඔහු සුදුසු වැටුප් තලයක තැබිය හැකිය.

**වයස.**—1973. 10. 31 දින අවුරුදු 25—40 අතර විය යුතුයි.

**සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයක ගෞරව උපාධිධරයකු විය යුතුව ඇති අතර, රජයේ හෝ රජයේ සංස්ථාවක මාණ්ඩලික නිලධාරියෙක් වශයෙන් අවුරුදු 3 ක අවම පලපුරුද්දක් තිබිය යුතුයි.

**නැතහොත්**

අවුරුදු 3 ක පලපුරුද්දක් ඇති අධිනීතිඥයකු විය යුතුය.

**නැතහොත්**

අවුරුදු 5 ක පලපුරුද්දක් ඇති (පෙරකදෝරු) නීතිඥයකු විය යුතුය.

10-236—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය.

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### තාවකාලික III ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුර

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාවකාලික III ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් [illegible] කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් පහත දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කොට 1973 නොවැම්බර් 20 වැනි දිනට හෝ ඊට පෙර මා [illegible] වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරට [illegible] වැටුප් පරිමාණය රු. 2,910—90×17—4,440 කි. රු. 3,810 වාර්ෂික වැටුප් ලක්ෂ්‍යයට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේය.

3. සේවය නියුක්ත කරවීමේ කොන්දේසි :
   1. තනතුරු තාවකාලිකය.
   2. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත බව.

(ආ) 1973. 11. 20 වැනි දිනට අවුරුදු 25ට නො අඩු හා අවුරුදු 45ට නොවැඩි බව, (දැනටමත් රජයේ නියුක්තව සිටින අයට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙවරකට නො වැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය, ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (මෙයින් එකක් ගණන් තැබීම විය යුතුය.) අධ්‍යාපන පොදු සහතික (සාමාන්‍ය පෙළ) හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක් නැතහොත් ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම.

(ඈ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක ගබඩා භාරකරුවකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 3 ක සේවයක් තිබිය යුතුය.

5. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ.) ස්වකීය ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය :—
   (i) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.
   (ii) උසස්ම අධ්‍යාපන සහතිකය සහ,
   (iii) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (මෙම පිටපත් ආපසු එවනු නොලැබේ)

6. දැනට රජය යටතේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩල යටතේ හෝ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

7. අයදුම්කරුවන් ස්වකීය වියදමින් ම කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පැමිණිය යුතු ය.

8. අයදුම්පතේ දී ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරා ගනු ලැබීමට ප්‍රථම සොයා ගතහොත් අයදුම්කරු නුසුදුස්සෙකු කිරීමට ද තෝරාගනු ලැබීමෙන් පසු සොයා ගතහොත් සේවයෙන් පහ කිරීමට ද සිදුවනු ඇත.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II අ) ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද රාජ්‍ය සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නා වූද කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ජී. පී. හත්කොටුව,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකාරිත්ව),
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙනුවට.

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973. 10. 04.

තාවකාලික III ශ්‍රේණියේ ගබඩා භාරකාර නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "තාවකාලික III ශ්‍රේණියේ ගබඩා භාරකාර නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපෑලෙන් කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ, හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1 යන ලිපිනයට එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.

(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

9. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදි කරුවී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

10. වරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදවි නාම :————.

————,
අත්සන.

දිනය :————.

11-75—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

ඇබෑර්තු

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තම නම සහ ලිපිනය ලියන ලද මුද්දර කවරයක් එවීමෙන් ලබා ගන්නා ඉල්ලුම්පත්‍ර මගින් අයදුම් කළ යුතුය.

මානක (මිනින්දෝරු) IV වැනි ශ්‍රේණිය

**වැටුප් පරිමාණය.**—සියලු දීමනා අඩංගුව මසකට රු. 800—10 × 40—රු. 1,200

**සුදුසුකම්.**—මිණුම් දෙපාර්තමේන්තුවේ දස අවුරුද්දක පළපුරුද්දක් සහිතව මැනීම සහ මට්ටම් කිරීම පිළිබඳ මිණුම්පතිගේ බලපත්‍රය තිබිය යුතුය. මිණුම් දෙපාර්තමේන්තුවේ නියත මට්ටම් කිරීම සහ ඉංජිනේරු මිණුම් පිළිබඳ පළපුරුද්දක් ඇතුළුව ඉඩම් සැකසුම, මිණුම් සහ පස් කැපීමේ වැඩ මිණුම් පිළිබඳ පළපුරුද්ද සහිතව කණිෂ්ඨ මිනින්දෝරුවන් පාලනය කිරීමේ හැකියාව අතිරේක සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

මෙම පත්වීම කරනු ලබන්නේ අවුරුදු දෙකක කොන්ත්‍රාත්තුවක් මතය. දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් එකඟ වන්නේ නම් රජයේ සේවයේ සිටින අයදුම් කරුවන් ද්විතීයනය කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.

මානක (මිනින්දෝරු) VI වැනි ශ්‍රේණිය

**වැටුප් පරිමාණය.**—සියලු දීමනා අඩංගුව මසකට රු. 450—14 × 25—රු. 800.

**සුදුසුකම්.**—මිණුම් දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවකු ලෙස වර්ෂ දෙකක පළපුරුද්ද සහිතව දියතලාවේ මිණුම් සහ සිතියම් සකස් කිරීමේ ආයතනය විසින් මැනීම සම්බන්ධව ප්‍රදානය කරන ලද ඩිප්ලෝමාවක් තිබිය යුතුය.

හෝ

මිණුම් දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවකු ලෙස වර්ෂ 5 ක පළපුරුද්දක් තිබිය යුතුය.

මිණුම් දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මිණුම් පිළිබඳ පළපුරුද්දක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

රසඥ—V වැනි ශ්‍රේණිය

**සුදුසුකම.**—විෂයයන් වශයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ගණිතය සහිතව බී.එස්.සී. (සාමාන්‍ය) උපාධිය හෝ ගණිතය අතිරේක විෂයයක් සහිතව බී.එස්.සී. (විශේෂ) රසායන විද්‍යා උපාධිය හෝ තිබිය යුතුය. රසායනික කර්මාන්තායතනයක පළපුරුද්දක් ඇති අයට විශේෂත්වයක් දක්වනු ඇත.

**වේතනය.**—තෝරාගනු ලබන අයදුම්කරුවන් දෙවර්ෂයක පුහුණුවීමේ කාලයකට යටත්වන අතර එම කාලපරිච්ඡේදය තුළ ඔවුන්ට රු. 600 ක මාසික දීමනාවක් ගෙවනු ලබන අතර, පුහුණුවීම සතුටුදායක ලෙස සම්පූර්ණ කළ පසු රු. 600—10 × 40—රු. 1,000 ක් වූන සියලු දීමනා අඩංගු මාසික වේතන පරිමාණයට පත් කරණු ලැබේ.

පිළිගත් රසායනික කර්මාන්තායතනයක අවුරුදු 5 කට වැඩි ප්‍රායෝගික පළපුරුද්දක් ලත් උපාධිධාරීන් ඉහත සඳහන් වේතන පරිමාණයේ පියවරකට කෙලින්ම පත්කිරීම ගැන සලකා බලනු ලැබේ.

රසඥ තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් පුහුණු වීමේ කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5ක් සංයුක්ත මණ්ඩලයේ සේවය කරන බවට සංයුක්ත මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

යාන්ත්‍රික ඉංජිනේරු IV වැනි ශ්‍රේණිය

**වේතන පරිමාණය.**—සියලු දීමනා අඩංගුව මසකට රු. 800—10 × 40—රු. 1,200

**සුදුසුකම්.**—පිළිගත් විශ්වවිද්‍යාලයක යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක් ලබා තිබිය යුතුය. ප්‍රායෝගික පුහුණුව අවසන් කළ සහ හෝ යම් කර්මාන්තායතනයක පළපුරුද්දක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

හෝ

පිළිගත් කාර්මික ආයතනයක ඩිප්ලෝමා හෝ සමාන සහතිකයක් සමඟ විශාල ඉංජිනේරු ආයතනයක පරිපාලන තත්වයේ අවුරුදු 7ක පළපුරුද්දක් ලබා තිබීම.

තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වේතන පරිමාණයේ සුදුසු පියවරක තැබීම පිළිබඳව සලකා බලනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් කන්තලේ, හිඟුරාන, උඩවලව හෝ වෙනත් ස්ථානයක පිහිටි සංයුක්ත මංඩලයේ ඕනෑම ආයතනයක සේවය කිරීමට ද සූදානම් විය යුතුය. ඔවුන් විසින් ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රතිපත්තියට අනුකූලව සිංහල භාෂාව පිළිබඳ ව ප්‍රවීණතාවක් ද ලබා ගත යුතුය.

රජයේ හෝ රජයේ සංස්ථාවන්හි නිලධාරීන් දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් අයදුම්පත් එවිය යුතුය.

අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, සභාපති, ශ්‍රී ලංකා සීනිසංයුක්ත මණ්ඩලය, තැ.පෙ. 1486, 651 ඇල්විටිගල මාවත, කොළඹ 5 යන ලිපිනයට 1973 නොවැම්බර් 16 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය.

1973 ඔක්තෝබර් මස 19 වැනි දින,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය,
තැ.පෙ. 1486,
කොළඹ 5.

11—133—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ අතින් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දහවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි

4. සෙනසුරාදා පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගනුදෙනු කාලය අවසන්වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ වැරදි වලක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් කර එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ රෙජිස්ට්‍රාර් තැනගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි —

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 30 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින ආසන්නව යෙදෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන්නට එවිය යුතුයි.

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු*—

සම්පූර්ණ ගැසට් පත්‍රය — වාර්ෂික

| | මෙරට රු. | මෙරට ශ. | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට අඩු නොවන කාලයකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | | මිළ රු. | මිළ ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | තැපැල් ගාස්තු මෙරට ශ. |
|---|---|---|---|---|---|---|
| (අ) | (i) | ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 | 50 | 0 | 20 |
| | (ii) | ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) | (i) | ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 30 | 0 | 15 |
| | (ii) | ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 60 | 0 | 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය** සඳහා **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල** ගොඩනැගිල්ලේ පිහිටි **රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම යැවිය යුතුය.**

**සැ. යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඔක්තෝබර් | ... | 5.10.73 | සිකුරාද | ... | 25. 9.73 | අඟහරුවාද | දහවල් | 12.00 |
| | | 12.10.73 | සිකුරාද | ... | 3.10.73 | බදාද | දහවල් | 12.00 |
| | | 19.10.73 | සිකුරාද | ... | 10.10.73 | බදාද | දහවල් | 12.00 |
| | | 26.10.73 | සිකුරාද | ... | 17.10.73 | බදාද | දහවල් | 12.00 |
| නොවැම්බර් | ... | 2.11.73 | සිකුරාද | ... | 24.10.73 | බදාද | දහවල් | 12.00 |
| | | 9.11.73 | සිකුරාද | ... | 31.10.73 | බදාද | දහවල් | 12.00 |
| | | 16.11.73 | සිකුරාද | ... | 7.11.73 | බදාද | දහවල් | 12.00 |
| | | 23.11.73 | සිකුරාද | ... | 14.11.73 | බදාද | දහවල් | 12.00 |
| | | 30.11.73 | සිකුරාද | ... | 21.11.73 | බදාද | දහවල් | 12.00 |
| දෙසැම්බර් | ... | 7.12.73 | සිකුරාද | ... | 28.11.73 | බදාද | දහවල් | 12.00 |
| | | 14.12.73 | සිකුරාද | ... | 5.12.73 | බදාද | දහවල් | 12.00 |
| | | 21.12.73 | සිකුරාද | ... | 12.12.73 | බදාද | දහවල් | 12.00 |
| | | 28.12.73 | සිකුරාද | ... | 19.12.73 | බදාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.